දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

# භූවිසා 2.1 - සම්පත් සංවර්ධනය හා සැලසුම්කරණය
# GYG 2.1 - Resource Development and Planning

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. (අ) "සම්පත්" (Resources) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යි අර්ථ දක්වන්න.
(ලකුණු 3)

(ආ) සම්පත් වර්ගීකරණය කොට, කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 5)

(ඇ) සම්පත් කෙරෙහි ඇති මානව ඇගයුම පුළුල් වීමෙහි ලා බලපාන සාධක උචිත නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
(ලකුණු 12)

02. "සම්පත් උපයෝජනයෙහි ලා ජනසංඛ්‍යාව තීරණාත්මක සාධකයකි." ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විමර්ශනය කරන්න.
(ලකුණු 20)

03. "ලෝකයේ කලාපීය හා රටවල් අතර පවත්නා සංවර්ධන විෂමතා කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වන්නේ සම්පත් ව්‍යාප්තියේ විෂමතාවයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? උචිත දත්ත හා නිදසුන් දක්වමින් විග්‍රහ කරන්න.
(ලකුණු 20)

04. මානව සම්පත් සංවර්ධනය කෙරෙහි මානව සෞඛ්‍ය හා රෝග ව්‍යාප්තිය දක්වන බලපෑම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් නිදසුන් ලෙස ගෙන සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

05. සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ ආහාර හිඟයයි. මෙම ගැටළුව කෙරෙහි බලපා ඇති සාධක පැහැදිලි කර, ජාත්‍යන්තර වශයෙන් මෙම ගැටළුවට විසඳුම් සෙවීමට දායකත්වය සපයන ආයතන 2 ක් නම් කර, ඒවයේ අරමුණු සහ දායකත්වයන් මොනවාදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

06. සංවර්ධනය වෙමින් පවතින රටවල සීඝ්‍රයෙන් වර්ධනය වන ජනගහනය ස්වාභාවික සම්පත් කෙරෙහි දක්වන පීඩනය අඛණ්ඩව සිදු වන බව 21 වැනි සියවස ආරම්භයේ සිට ම පැහැදිලි වන්නකි. මෙම කියමනට ඔබ එකඟ වන්නේ ද? නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

07. (i) සම්පත් සංරක්ෂණය යනු කුමක් ද? අර්ථ දක්වන්න.

(ලකුණු 2)

(ii) සම්පත් සංරක්ෂණය සහ කළමණාකරණයෙහි ප්‍රධාන අරමුණු හා පරමාර්ථ පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(iii) සම්පත් සංරක්ෂණය සහ කළමණාකරණය සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දිය යුත්තේ කෙසේ ද යන්න විභාග කරන්න.

(ලකුණු 10)

08. 21 වැනි සියවස ආරම්භයේ සිට සංවර්ධනය වෙමින් පවතින රටවල් ස්වභාවික සම්පත් සම්බන්ධයෙන් විවිධ අභියෝගයනට මුහුණ දෙමින් සිටී. මෙම රටවල් "තිරසර සංවර්ධන සංකල්පය" කෙරෙහි මුහුණ දෙන්නේ කෙසේ ද යන්න පිළිබඳව තර්කාන්විතව අදහස් දක්වන්න.

(ලකුණු 20)

✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡